# තත්ත්ව විශ්ලේෂණය

## *පසුබිම:*

බොහෝ යටත්විජිත රටවල මෙන් ම ශ්‍රී ලංකාව තුළ ද බ්‍රිතාන්‍ය පාලන සමයෙහි සම්මත කළ යටත්විජිතවාදී නීති තවමත් බල පවත්වයි. වික්ටෝරියානු සදාචාරය පිළිබිඹු කරන මෙම නීති දැඩි ලෙස විවේචනයට ලක්ව ඇත. සමලිංගිකතාවට එරෙහි නීතිය එවැනි එක් නීතියකි. පසු කාලයේ ශ්‍රී ලංකාව තුළ කාන්තා අයිතිවාසිකම් සම්බන්ධ අතිශය ප්‍රගතිශීලී නීති සම්මතව තිබෙන නමුත්, ලිංගිකත්වය පිළිබඳ ගැටලුව තවමත් අභියෝගයක්ව පවතී. පුද්ගලයන්, මාධ්‍යය සහ ආගමික සංවිධාන විසින් LGBT[1] පුද්ගලයන්ට එරෙහිව කරන ප්‍රචණ්ඩ ක්‍රියා නිසා LGBT නිදහස වෙනුවෙන් වන මහජන ව්‍යාපාරයක් වර්ධනය වීමට තිබෙන ඉඩකඩ අඩු වී ඇත. මේ නිසා ලිංගිකත්වය පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ දැනුවත් කිරීම් සිදු කිරීමට තිබෙන හැකියාව සීමා වී ඇත. සමාන අයිතිවාසිකම් නොමැතිකම සහ සාපරාධී ජීවිත ගත කරන්නන් ලෙස හංවඩු ගැසීම හේතුවෙන් LGBT පුද්ගලයන් මුහුණ දෙන ප්‍රචණ්ඩත්වයන් ලේඛනගත කිරීමට ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනය අධ්‍යයනයක නිරත වූයේ මෙම තත්ත්වය තුළ ය. අධ්‍යයනයේ ඉලක්කය නම්, ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365ඒ වගන්තිවලින් LGBT පුද්ගලයන්ගේ ජීවිතවලට සිදු වන වක්‍ර බලපෑම් අවබෝධ කර ගැනීම යි. අධ්‍යයනයේ අරමුණ නම් රැස් කර ගත් තොරතුරු ප්‍රයෝජනයට ගෙන නීතිඥයන් සඳහා පුහුණු මොඩියුලයක් නිර්මාණය කිරීම සහ එල්ජීබීටී ගැටලු කෙරෙහි සංවේදී, එල්ජීබීටී පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කළ හැකි නීතිඥ ජාලයක් නිර්මාණය කිරීම සඳහා ශ්‍රී ලංකාව පුරා නීතිඥයන් සඳහා පුහුණු පැවැත්වීමයි.

## *ක්‍රමවේදය:*

නීතිය සහ LGBT පුද්ගලයන්ට ඉන් ඇති වන බලපෑම සම්බන්ධ වත්මන් තත්ත්වය තක්සේරු කිරීමේ දී මෙම අධ්‍යයනය යොදා ගන්නේ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ක්‍රමවේදයකි. ගුණාත්මක අධ්‍යයනය පදනම් වන්නේ, ලිංගිකතාව සහ නීතිය සම්බන්ධ ගැටලු පිළිබඳව සහ වෙනස්කම් කිරීම සහ ඉන් ඇති වන බලපෑම් පිළිබඳව ලියූ ලිපි, ඇතැම් මාතෘකාවන්ට අදාළව විශේෂඥයන් සැපයූ යෙදවුම් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා මත ය. ප්‍රමාණාත්මක අධ්‍යයනය පදනම් වන්නේ දිස්ත්‍රික්ක නවයක සහ නගර දහයක පැවැත්වූ සම්මුඛ සාකච්ඡා මත ය. පොලීසිය, නීතිඥයන්, වෛද්‍ය වෘත්තිකයන්, LGBT ප්‍රජා සාමාජිකයන් සහ මානව අයිතිවාසිකම් සංවිධාන/ක්‍රියාකාරකයන් යන පාර්ශ්වකරුවන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්විණ. ගුණාත්මක අධ්‍යයනය ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් තුන ම නියෝජනය කරයි. පැවැත්වූ මුළු සම්මුඛ සාකච්ඡා සංඛ්‍යාව 109කි.

---

[1] මෙම වාර්තාව තුළ දී LGBT එල්ජීබීටී යන්නෙන් ඇඟවෙන්නේ, සමසෙනෙහස් ස්ත්‍රීන්, සමසෙනෙහස් පුරුෂයන්, ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවයටම ආදරය කරන්නන් සහ සංක්‍රාන්ති ස්ත්‍රී-පුරුෂභාවී පුද්ගලයන් ය ( සංක්‍රාන්ති ස්ත්‍රී-පුරුෂභාවී පුද්ගලයන් යනු පුරුෂයකුව සිට ස්ත්‍රියක් ලෙස, ස්ත්‍රියකව සිට පුරුෂයකු ලෙස වෙනස් වූ හෝ එසේ හැසිරෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවී සාම්ප්‍රදායික ක්‍රියාකාරිත්වයන් ඉටු නොකරන පුද්ගලයන් ය (විරුද්ධ ලිංගිකයන්ගේ ඇඳුම් පැලඳුම් අඳින පලඳින).

සීමා:

1. ප්‍රමාණාත්මක අධ්‍යයනය පුළුල්ව සිදු කළ නොහැකි වූ අතර, එහි අවධානය යොමු වූයේ ඒ ඒ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරය වැනි නාගරික ප්‍රදේශ කෙරෙහි පමණකි.

2. 365 සහ 365 අ වගන්ති යටතට වැටෙන ළමා අපයෝජන නඩුවලට සහ වැඩිහිටියන් අතර කැමැත්තෙන් සිදු වූ ලිංගික ක්‍රියාවන්ට අදාළ අධිකරණ නීති පහසුවෙන් සපයා ගත නොහැකි විය. වාර්තාව විශාල වශයෙන් පදනම් වන්නේ, විවිධ සංවිධානවලින් ප්‍රකාශයට පත් කොට ඇති ළමා අයිතිවාසිකම් සම්බන්ධ ලිපි මත ය.

## *365 සහ 365 අ වගන්තිවල ඉතිහාසය*

දණ්ඩ නීති සංග්‍රහයේ 365 වන වගන්තිය මෙසේ ප්‍රකාශ කරයි:
'කිසියම් පුරුෂයෙකු, කාන්තාවක හෝ සතෙකු සමග ස්වකැමැත්තෙන් ස්වභාවධර්මයට එරෙහිව කාමුක සංසර්ගයේ යෙදෙන කවරෙකුට වුව දස වසරක් දක්වා දීර්ඝ විය හැකි සාමාන්‍ය හෝ බරපතළ සිර දඬුවමක් ලබා දිය යුතු අතර, ඒ කවර හෝ පුද්ගලයා දඩයකට ද යටත් කළ යුතු ය.'[2]

1995 වසරේ අවසානය වන තෙක්, එහි 365 අ උප වගන්තියෙන් ප්‍රකාශ වූයේ මෙය යි:
'ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ තවත් පිරිමියෙකු සමග කවර හෝ තදබල අශෝභන ක්‍රියාවක යෙදෙන හෝ එසේ කිරීමට තවත් අය සමග හවුල් වන හෝ වෙන යම් පිරිමියෙකු ලවා එසේ කිරීමට උත්සාහ කරන හෝ ප්‍රයත්න දරන ඕනෑ ම පිරිමියෙකු අපරාධයකට වරදකරු විය යුතු අතර, ඒ කවර හෝ පුද්ගලයා ඇතැම් විට දෙවසරක් දක්වා දීර්ඝ විය හැකි සාමාන්‍ය හෝ බරපතළ සිර දඬුවමකට හෝ දඩයකට හෝ ඒ දෙකට ම යටත් කළ යුතු ය, කස පහරට ද ලක් කළ යුතු ය.'[3]

1883 දී ශ්‍රී ලංකාව තුළ මෙම නීති සම්මත කළේ තම යටත්විජිතවල වික්ටෝරියානු සාරධර්ම ආරෝපණය කිරීමට පරිශ්‍රම දරමින් සිටි බ්‍රිතාන්‍යයන් ය. 1860 දී ඉන්දියානු නීති කොමිසමේ සභාපති මැකෝලේ සාමිවරයා ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහයේ 377 වන වගන්තිය ඇතුළත් කළ යුතු යැයි නිර්දේශ කළේ ය. පසුව ශ්‍රී ලංකාව වැනි වෙනත් යටත්විජිතවල ද ඊට සමාන නීති බලාත්මක කෙරිණ.[4] මැකෝලේගේ මුල් කෙටුම්පත, 'අස්වාභාවික කාමයෙන් යුතුව කිසි යම් පුද්ගලයෙකු ස්පර්ශ කරන' ඕනෑ ම පුද්ගලයෙකුට දඬුවම් පැමිණවිය යුතු යැයි නියම කළේ ය.[5] එවැනි දුරාචාරවත් ක්‍රියා සම්බන්ධ

---

[2] ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 365 වන වගන්තිය.
[3] 1995 සංශෝධනයට පෙර දණ්ඩ නීති සංග්‍රහයේ 365ඒ වගන්තිය.
[4] Misra. G., Decriminalising homosexuality in India; *Reproductive Health Matters* (මිස්රා ජී., ඉන්දියාව තුළ සමලිංගිකතාව නිරපරාධී කිරීම, *ප්‍රජනක සෞඛ්‍යය පිළිබඳ ගැටලු*), 2009, http://vidyarogya.com/images/pdf/16-03-2011/decriminalising_homosexuality_india.PDF, පිවිසුණේ 2013/10/01.
[5] සී1 361: "අස්වාභාවික කාමය පිනවීමට අදහස් කරන, එම අභිමතාර්ථයෙන් කිසි යම් පුද්ගලයෙකු හෝ කිසි යම් සත්වයෙකු ස්පර්ශ කරන හෝ අස්වාභාවික කාමය පිනවීමේ අභිමතාර්ථයෙන් යුතුව තමන් ස්පර්ශ කිරීමට ස්වකැමැත්තෙන් කිසි යම් පුද්ගලයෙකුට ඉඩ දෙන කවරෙකු වුව ඇතැම් විට වසර 14ක් දක්වා දීර්ඝ විය හැකි සහ වසර දෙකකට නොඅඩු සාමාන්‍ය

විවාදයක් කිරීමට මැකෝලේ එරෙහි වූ බැවින් නීතිය සම්මත වූයේ එතරම් විවාදයකින් තොරව ය. එම නිසා නීතියේ භාෂාව අපැහැදිලි ය. එහි කාමුක සංසර්ගය හෝ ස්වභාව ධර්මයේ නියමයට පටහැණිව යාම යනු කුමක් දැයි යන්න සම්බන්ධව කිසිදු අර්ථ නිරූපණයක් නැත. පසුව ඉන්දියානු අධිකරණ මේ පිළිබඳ අර්ථ නිරූපණ වර්ධනය කොට පුළුල් කළේ ය. සඳහන් කළ යුතු වැදගත් කරුණක් නම්, 'ස්වභාව ධර්මයේ නියමයට පටහැණිව යාම' යන යෙදුම ප්‍රජනනය අරමුණු නොවන ලිංගික හැසිරීම ලෙස අර්ථ නිරූපණය කර තිබීම යි. මෙම නානාවිධ නඩු තීන්දුවලින් පෙනී ගියේ විවාහ සංස්ථාව සහ විෂමලිංගිකධර්මතාමය සාරධර්මයන් (heteronormative values) බලාත්මක කිරීමේ දී රාජ්‍යයට පුද්ගලයාගේ පෞද්ගලික ජීවිතයට පිවිසිය හැකි බව යි. ශ්‍රී ලාංකික අධිකරණයන් අර්ථ නිරූපණ ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන නැති නමුත් මෙම නීතිය සම්බන්ධ ශ්‍රී ලංකාවේ ඉතිහාසය ද මීට සමාන ය.

1995 දී පාර්ලිමේන්තුව දණ්ඩ නීති සංග්‍රහයට අදාළ සංශෝධන කිහිපයක් අනුමත කළේ ය. අවසර දිය හැකි සහ තහනම් කළ යුතු ලිංගික සම්මුඛ වීම් පාලනය කිරීම සමග මෙම සංශෝධනයන්හි පසුබිම බෙහෙවින් ගැළපිණ. සංශෝධන සිදු වූයේ ළමා ලිංගික අපයෝජනය වැඩි වී තිබුණු කාලයක ය. ඒවායේ අවධානය යොමු වූයේ විදේශිකයන් අතින් තරුණ පිරිමි ළමයින් අපයෝජනයට ලක් වීම පිළිබඳව ය. එහෙත්, ඒවා පවුල් ව්‍යුහය තුළ දී ළමයින් අපයෝජනයට ලක් වීම නොතකා හළ බව සැලකිය යුතු ය. 1990 ගණන් මුල දී ළමා ලිංගික අපයෝජන සිද්ධි වැඩි වැඩියෙන් වාර්තා වීම පිළිබඳව ඇති වූ සැලකිලිමත් වීම් ඔවුන්ට මෙහි දී බොහෝ සෙයින් බලපෑවේය. [6]

රජය විසින් පිහිට වූ තාක්ෂණික කමිටුව නානාවිධ පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත වූ අතර එය ප්‍රගතිශීලී නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කළේ ය. වැඩිහිටියන් අතර ස්වකැමැත්තෙන් සිදුවන මෛථුන්දම සාපරාධී කළ 365 සහ 365අ වගන්ති අවලංගු කිරීම ඉන් එකකි. කෙසේ වුව ද, මෙම නිර්දේශයන් නොතකා හැරි අතර වඩා ප්‍රතිගාමී සංශෝධනයක් සම්මත කෙරිණ. වයස දහඅටට වඩා වැඩි කෙනෙකු වයස දහසයට වඩා අඩු කෙනෙකුට මෙම අපරාධය කළ හොත් වසර දහයත් විස්සත් අතර බරපතළ සිර දඬුවමක් පැනවිය හැකි පරිදි දණ්ඩනය වැඩි කිරීමට 365 වන වගන්තිය සංශෝධනය කෙරිණ. දෙවන සංශෝධනය අදාළ වූයේ 365 අ වගන්තියට[7], එනම් තදබල අශෝභන ක්‍රියා සම්බන්ධයෙනි. 'ඕනෑ ම පිරිමියෙකු' යන වචන සංශෝධනය වී 'ඕනෑ ම පුද්ගලයෙකු' යන වචන ඒ වෙනුවට එකතු කෙරුනු

හෝ බරපතළ සිර දඬුවමකට යටත් කළ යුතු ය. Gupta. A. Section 377 and the dignity of Indian Homosexuals, *Economic and Political Weekly* (ගුප්තා ඒ., 377 වන වගන්තිය සහ ඉන්දියානු සමලිංගිකයන්ගේ අභිමානය, *ඉකොනොමික් ඇන්ඩ් පොලිටිකල් වීක්ලි*), 2006 නොවැම්බර් 18, http://www.iglhrc.org/binary-data/ATTACHMENT/file/000/000/15-1.pdf ලිපියෙහි උපුටා දක්වා ඇති පරිදි ය.

[6] Tambiah (තම්බයියා).

[7] වත්මන් වගන්තියෙන් මෙසේ කියැවේ - "ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ තවත් පුද්ගලයෙකු සමග කවර හෝ තදබල අශෝභන ක්‍රියාවක යෙදෙන හෝ එසේ කිරීමට තවත් අය සමග හවුල් වන හෝ වෙන යම් පුද්ගලයෙකු ලවා එසේ කිරීමට උත්සාහ කරන හෝ ප්‍රයත්න දරන ඕනෑ ම පුද්ගලයෙකු අපරාධයකට වරදකරු විය යුතු අතර, ඒ කවර හෝ පුද්ගලයා ඇතැම් විට දෙවසරක් දක්වා දීර්ඝ විය හැකි සාමාන්‍ය හෝ බරපතළ සිර දඬුවමකට හෝ දඩයකට හෝ ඒ දෙකට ම යටත් කළ යුතු ය; වයස දහඅටට වඩා වැඩි පුද්ගලයෙකු වයස දහසයට වඩා අඩු පුද්ගලයෙකුට අපරාධය කරන අවස්ථාවල දී දඩ මුදලක් ද සහිතව දෙවසරකට නොඅඩු සහ විසි වසරකට නොවැඩි බරපතළ සිර දඬුවමක් පැනවිය යුතු අතර, අපරාධයට ලක් වුණු පුද්ගලයාට සිදු වුණු තුවාල සඳහා එම පුද්ගලයාට උසාවියෙන් තීරණය කෙරෙන ප්‍රමාණයක වන්දියක් ගෙවන ලෙස ද නියම කළ යුතු ය.'"

අතර ඒ හරහා මෙම වගන්තිය ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශ්වයට ම අදාළ කෙරිණ. ඒ හරහා කාන්තාවන්ට ද මෙම නීතියේ සීමාවන් අදාළ කෙරුණු අතර ඒ අනුව කාන්තාවන්ට ද 365 වන වගන්තියට සමාන දඬුවම් නියම කෙරිණ. උසාවියෙන් තීරණය කරන ලද වන්දියක් වයස දහසයට වඩා අඩු පුද්ගලයාට ගෙවිය යුතු බවට විධිවිධානයක් ද මෙම වගන්තියෙහි තවදුරටත් ඇතුළත් විය.

## *365 සහ 365 අ වගන්ති අතර පවත්නා නීතිමය වෙනස්කම්*

365 සහ 365අ වගන්ති අපරාධ වර්ග දෙකක් කෙරෙහි අවධානය යොමු කරයි. 365 වගන්තිය කාමුක සංසර්ගය සිදු විය යුතු බව ප්‍රකාශ කරයි. 365 වගන්තියේ පැහැදූම ප්‍රකාශ කරන්නේ අපරාධය සම්පූර්ණ වීමට ගාහනය (ඇතුළු කිරීම) සිදු විය යුතු බව යි.[8] මේ අනුව, 365 වගන්තිය පටු අර්ථ දැක්වීමක් වන අතර, ගාහනය අවශ්‍ය බව කියා සිටී. කෙසේ වුව ද, උසාවිය සතුව අර්ථ නිරූපණ බලතල තිබෙන අතර, ඉන්දියානු උසාවි කර තිබෙන පරිදි ගාහනය යන වචනය පුළුල්ව අර්ථ නිරූපණය කළ හැකි ය. 365 වගන්තිය යටතේ අපරාධ වගකීමට ලක් වන්නේ ක්‍රියාවට සම්බන්ධ පාර්ශ්වයන් දෙක පමණකි. එහෙත්, 365අ වගන්තියෙන් අපරාධ බවට පත් කෙරෙන ක්‍රියාවන් පුළුල් ය. එහි විෂය පථය තුළ දී ස්වභාවයෙන් ලිංගික අශ්ලීල යැයි සැලකෙන ඕනෑ ම ක්‍රියාවක් අපරාධයක් බවට පත් කළ හැකි ය. තදබල අශෝභන ක්‍රියාව යන යෙදුම අර්ථ දක්වා නැත. 365 අ වගන්තිය යටතේ, ක්‍රියාවේ දී 'උපකාර කරන' කවරෙකුට වුව ද දඬුවම් පැමිණවිය හැකි ය. අපරාධ දෙකට ම ලැබෙන්නේ සමාන දඬුවමක් වන අතර, බාලවයස්කාරයන්ට එරෙහිව සිදු කළ අපරාධයේ බරපතළකම අනුව 10 වසරක් දක්වා වන බරපතළ සිර දඬුවමක් ලබා දිය හැකි ය. අවස්ථා දෙකේ දී ම කැමැත්ත සැලකිල්ලට නො ගැනේ.

## *365/365 අ වගන්ති පිළිබඳ නීතිමය අර්ථ නිරූපණ*

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 අ වගන්ති ඉන්දියාවේ දී මෙන් නීතිමය කතිකාවේ කොටසක් බවට පත් වී නැත. කෙසේ වුව ද ඉහත සිදුවීම් දෙක විමසා බලන විට, විජිතවාදී යුගවල සිට අද දක්වා ම උසාවි සහ සම්මුඛ සාකච්ඡාවල දී නීතිඥයන් සහ පොලිස් නිලධාරීන් කළ අර්ථ නිරූපණ කාමුක සංසර්ගය සහ තදබල අශෝභන ක්‍රියාව යන යෙදුම් කෙරෙහි අවධානය යොමු කර ඇත. සංක්ෂිප්ත ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයට (නව වන සංස්කරණය, 1995) අනුව, " කාමුක (carnal)" යන යෙදුමෙන් අදහස් වන්නේ ශරීරයට අයත් හෝ මාංශය, ලෞකික, භෞතික සතුට සම්බන්ධව වූ, ලිංගික යනාදියයි. යෙදුම අවම අර්ථයෙන් සලකා බැලුව ද පුරුෂයන් සහ ස්ත්‍රීන් අතර ලිංගික ක්‍රියාවන් ඇතුළත් කර ගනිතත්, ඇතැම් ලිංගික ක්‍රියාවන් අපරාධ බවට පත් කිරීමෙන් ලිංගික සංසර්ගය සහ කාමුක සංසර්ගය අතර වෙනසක් නිර්මාණය කර ඇති බව නීතිය සහතික කර ඇත. කාමුක යන්න අස්වාභාවික/ස්වභාව ධර්මයේ නියමයට එරෙහි යන්නට සමාන කර ඇත.[9] කාමුක *සංසර්ගයේ ස්වාභාවික* අරමුණ සකස් වූයේ මිනිසුන් පිළිසිඳ ගැනීමේ ඉඩකඩ පැවතිය යුතු බව අදහස් කිරීමට ය. තදබල අශෝභන ක්‍රියා යන්නට පුළුල් විෂය පථයක් ඇති අතර, ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය අසභ්‍ය තොරතුරු

---

[8] 365 වගන්තියේ පැහැදූම - 'මෙම වගන්තියේ විස්තර කෙරෙන අපරාධය සඳහා අවශ්‍ය මෛථුනය සනාථ වීමට ගාහනය ප්‍රමාණවත් ය.'

[9] Lohana Vasantlal Devchand vs. The State AIR 1968 Guj 252, 1968 CriLJ 1277, (1968) GLR 1052

කියවීම හෝ නැරඹීම ඇතුළු ස්වභාවයෙන් ලිංගික වන ඕනෑ ම ක්‍රියාවක් ඊට ඇතුළත් කළ හැකි ය. එය ස්වභාවයෙන් ලිංගික වන, අනභිමත ඕනෑ ම ක්‍රියාවක් විය හැකි ය. එවිට, අභිමත දෑ තීරණය කළ යුත්තේ උසාවිය, රාජ්‍යය සහ සමාජය යි.

එහෙත්, ශ්‍රී ලාංකික උසාවි ලිංගික සංසර්ගය ප්‍රතික්ෂේප කිරීමක් සිදු වී ඇති අවස්ථාවල දී දික්කසාද පිළිබඳ අභියාචන පිළිගෙන තිබෙන බව සඳහන් කළ යුතු ය. එක් අවස්ථාවක දී, කලත්‍රයා සමග කාමුක සංසර්ගයේ යෙදීම ප්‍රතික්ෂේප කිරීම දික්කසාද වීමට පදනමක් යැයි පවා උසාවිය ප්‍රකාශ කළේ ය.[10] එවිට, අභිමත මිනුම් දණ්ඩට අයත් ඕනෑ ම ලිංගික ක්‍රියාවක දී විවාහයට අවසර ලැබෙන්නේ යැයි මෙම උදාහරණය සහ ඉන්දියානු උසාවිවල අත්දැකීම පදනම් කර ගෙන අපට තර්ක කළ හැකි ය.

මෙම නීතියේ විෂය පථයට ප්‍රජනක නොවන සියලු ක්‍රියාකාරකම් ඇතුළත් කර ඇති ඉන්දියානු නීතිමය පූර්වාදර්ශවලට වෙනස් ලෙස මෙම යෙදුම් පටු ලෙස අර්ථ දක්වා ඇතැයි පැවසීමට නිරපරාධී කිරීම අභියෝගයක්ව තිබෙන අතරතුර අවස්ථාවක් ලැබී තිබෙන්නේ යැයි 365 සහ 365 අ වගන්ති පිළිබඳව නීතිමය කතිකාවක් නොමැති තතු යටතේ අපට තර්ක කළ හැකි ය.

## *එල්ජීබීටී පුද්ගලයන් සහ වෙනත් අය වරදකරුවන් කිරීම සඳහා 1948 සිට එය යොදා ගෙන තිබෙන්නේ කෙසේ ද?*

ශ්‍රී ලංකාව තුළ නඩු සුලු සංඛ්‍යාවක දී, නීතිය අර්ථ දක්වා ඇති ආකාරය පිළිබඳව පූර්ණ විශ්ලේෂණයක් කිරීම 365 සහ 365අ වගන්ති නිසා වැළකී ඇත. එහෙත්, එල්ජීබීටී පුද්ගලයන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා සහ එල්ජීබීටී සංවිධාන එක්සත් ජාතීන් වෙත යොමු කළ වාර්තා සහ නානාවිධ අභිදේශන වැඩ පිළිවෙළවල් හරහා පෙනී යන්නේ, වගන්ති බොහෝ විට යොදා ගැනෙන්නේ එල්ජීබීටී පුද්ගලයන් තැති ගැන්වීමට, ඔවුන්ට අඩන්තේට්ටම් කිරීමට සහ බලාත්කාරකම් පෑමට බව යි. කෙසේ වුව ද මෑත දී තදබල අශෝභන ක්‍රියාව පිළිබඳ චෝදනා යටතේ කොටුවේ දී පුරුෂයෝ දෙදෙනෙක් අත් අඩංගුවට ගන්නා ලදහ.[11]

ලේඛනගත වී තිබෙන උදාහරණ දෙකකින් එකක් නම්, වයස 16ට අඩු ළමයෙකු ලිංගික අපයෝජනයට ලක් කිරීම පිළිබඳව අවධානය යොමු කළ **වික්‍රමසිංහට එදිරිව කිංග්** නඩුව යි. චූදිතයාට තදබල අශෝභන ක්‍රියාව සම්බන්ධයෙන් චෝදනා කෙරිණ.

හමුදා සාමාජිකයෙකුට එරෙහිව සමලිංගිකතාව පිළිබඳව චෝදනා කෙරුණු **දලුවත්තට එදිරිව අමරසිංහ** නඩුවේ දී, නිසි නීතිමය ක්‍රියා පටිපාටි අනුගමනය නොකෙරුණු බවට චෝදනා කරමින් විත්තිකරුවා සර්ටියෝරාරි හසුනක් ගොනු කළේ ය. මෙහි දී, උසාවිය සමලිංගිකතාව පිළිබඳ පැතිකඩ කෙරෙහි අවධානය යොමු නොකළ අතර ක්‍රියා පටිපාටිමය අක්‍රමිකතාව පදනම් කර ගෙන නඩුව නිෂ්ප්‍රභ කළේ ය යන්න සැලකිය යුතු කරුණකි.

---

10 Pathmanayaky v. Mahenthiran, CA125/84(F), 2003

11

## *වෙනත් රටවල් මෙම වගන්ති අර්ථ නිරූපණය කර තිබෙන ආකාරය*

මෙම කොටසේ දී වාර්තාවේ විමසුමට ලක් වන්නේ දකුණු ආසියාවේ වෙනත් රටවල් මෙම වගන්ති කෙරෙහි අවධානය යොමු කර ඇති ආකාරය පිළිබඳව ය.

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 365 වන වගන්තියට සමාන ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහයේ 377 වගන්තියට අදාළ අධිකරණ නීති පිළිබඳව ඉන්දියාවට දිගු ඉතිහාසයක් ඇත.[12] 2009 දී දිල්ලි මහාධිකරණය සිය තීන්දුවක ප්‍රධාන කාරණය බවට ව්‍යවස්ථානුකූල සදාචාරය පත් කරමින් 377 වන වගන්තිය අර්ථ දක්වා මහත් ප්‍රශංසාවට ලක් වූ තීන්දුවක් දුන්නේ ය. කෙසේ වුව, නාස් තීන්දුවට පෙරාතුව ද 377 වන වගන්තිය කෙරෙහි අවධානය යොමු කළ තීන්දු කිහිපයක් උසාවිවලින් ලබා දී තිබිණ. ලේඛනගත එවැනි නඩු පනහක් පවතින අතර මෙම වාර්තාව ඉන් කිහිපයක් උපුටා දක්වනු ඇත.

***අධිරාජයාට එරෙහිව ඛානු***[13] යනු 377 වන වගන්තිය කෙරෙහි අවධානය යොමු කරන ලේඛනගත නඩු අතර මුලින් තිබෙන එකකි. වගන්තිය අර්ථ නිරූපණය කරමින් කෙනඩි ඒ.ජේ.සී. ගත් ස්ථාවරය වූයේ එය "මිනිසුන් ද ඇතුළු ස්වභාව ධර්මයේ නියමයට පටහැණිව යමින් මෛථුනයෙහි යෙදෙන ඕනෑ ම පුද්ගලයෙකුට දඬුවම් පමුණුවන" බව යි. එම නිසා විනිශ්චයකරුගේ ස්ථාවරය වූයේ "මෛථුනයේ ස්වාභාවික අරමුණ විය යුත්තේ මිනිසෙකු පිළිසිඳ ගැනීමට අවස්ථාව සැලසීම බැවින්" මෙම නඩුවේ දී සිදුව තිබුණු මුඛ ලිංගික ක්‍රියාව "ස්වභාව ධර්මයේ නියමයට පැහැදිලිව ම පටහැණිව යාමක්" බව යි.

***රාජස්ථාන ප්‍රාන්ත රජයට එරෙහි කෙඩාර් නාත්*** [14] නඩුවේ දී උසාවිය අවධානය යොමු කළේ ළමා ලිංගික අපයෝජනයක් පිළිබඳව ය. උසාවිය විත්තිකරුවා වරදකරු ය යන ස්ථාවරය දරා සිටින අතරතුර 377 වන වගන්තියේ අර්ථ නිරූපණ සහ ඉලක්ක විමසා බැලී ය. මීට පෙරාතුව ඉන්දියානු උසාවිය හමුවෙහි ළමා ලිංගික අපයෝජන නඩු කිහිපයක් ගොනු කර තිබූ අතර, ඒවායේ දී උසාවිය 377 වන වගන්තිය සැලකිල්ලට ගෙන තිබුණේ ඉන්දියාව තුළ ළමා ලිංගික අපයෝජනය පිළිබඳව අවධානය යොමු කරන එවැනි වෙනත් පුළුල් නීතියක් නොමැති ලෙස සලකමිනි. කෙසේ වුව ද, මෙම නඩුවල දී ස්වකැමැත්ත ඇතිව සිදුවන වැඩිහිටි සහ ළමා ලිංගික අපයෝජන නඩු එකිනෙකින් වෙන් කොට හඳුනා ගැනීමට උසාවිය අසමත් වූ බව බොහෝ විට දැකිය හැකි ය.

***නොෂිර්වාන්*** [15] ***සහ මින්වාල්ලා*** [16] නඩුවේ දී, තදබල අශෝභන ක්‍රියාව සහ සුවිශේෂ ආකාරවල පුද්ගලයන්

---

[12] 377 වන වගන්තියඃ අස්වාභාවික අපරාධ - ස්වභාව ධර්මයේ නියමයට පටහැණිව යමින් කවර හෝ පුරුෂයෙකු, ස්ත්‍රියක හෝ සත්ත්වයෙකු සමග ස්වකැමැත්තෙන් මෛථුනයෙහි යෙදෙන ඕනෑ ම කෙනෙකුට ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් හෝ ඇතැම් විට වසර දහයක් දක්වා විය හැකි සාමාන්‍ය හෝ බරපතළ සිර දඬුවමක් ද දඩයක් ද නියම කළ යුතු ය. පැහැදිලි කිරීම - මෙම වගන්තිය තුළ විස්තර වන අපරාධය සඳහා අවශ්‍ය කරන කාමුක සංසර්ගය වරද ස්ථාපනය වීමට ගාහනය (ඇතුලු කිරීම) පමණක් වුව ප්‍රමාණවත් ය.

[13] AIR 1925 Sind.

[14] 1985 (2) WLN 560.

[15] Noshirwan vs. Emperor AIR 1934 Sind 206.

[16] D P Minwalla vs. Emperor AIR 1935 Sind 78.

" අතර පවත්නා සම්බන්ධය වැඩි කරමින් අදාළ ක්‍රියාවේ විශේෂත්වය බැරෑරුම් සැලකිල්ලකට ලක් කරනු වෙනුවට, විත්තිකරුවන් ඇබ්බැහියෙන් තදබල අශෝභන ක්‍රියාවෙහි යෙදුණා මෙන් පෙනී යතැ'යි හෝ යෙදුණා විය හැකි යැයි තීන්දු කෙරිණ.

377 වන වගන්තිය යටතේ ගොනු කෙරුණු නඩු විභාග කිරීම තුළ දක්නට ලැබෙන සඳහන් කළ යුතු වැදගත් කරුණක් නම් සදාචාරය අර්ථ නිරූපණය කිරීමේ දී සහ යළි අර්ථ නිරූපණය කිරීමේ දී නීතියේ බලතල තව තවත් පුළුල් වී ඇති බව පෙනී යාම යි. 1980 ගණන් වන විට ඉන්දියානු උසාවි විකෘත ලිංගික ක්‍රියා සහ සමලිංගිකතාව අතර සම්බන්ධය වැඩි කිරීමට ක්‍රියා කළේ ය. ***ෆසාල් රාබ්*** [17] නඩුවේ දී එවැනි තීන්දුවක් ලබා දුන් අතර පසුව ***පූරන් රාම්*** [18] නඩුවේ දී එම තීන්දුව ශක්තිමත් විය.

අධිකරණ ශාලාව තුළ සිදු වූ ස්ත්‍රී දූෂණ පිළිබඳ විවාදයේ ප්‍රධාන කාරණය බවට සහමතිය (කැමැත්ත) පත්ව තිබෙන අතරතුර නීතියේ ඇස් ඉදිරියේ එය නොවැදගත් දෙයක් බවට පත් වෙමින් තිබීම උත්ප්‍රාසයට කරුණක් විය. ***ඔරිස්සා ප්‍රාන්ත රජයට එරෙහිව මිහිර්*** [19] නඩුවේ දී විනිශ්චයකරු ප්‍රකාශ කළේ "ශිෂ්ට සම්පන්න සමාජය අස්වාභාවික මෛථුනය පිළිකුල් කරන" බැවින් 'අපරාධයට ලක් වූ තැනැත්තාගේ' සහමතිය නොවැදගත් බව යි. ***රාජ්‍යයට එරෙහිව සහෝදර ජෝන් ඇන්ටනි*** [20] නඩුව පැන නැංගේ මුඛ ලිංගික ක්‍රියාවන්හි මෙන් ම ස්වයං මෛථුනයෙහි ද යෙදීමට ළමයින්ට බල කළ ගුරුවරයෙකුට එරෙහිව නේවාසික පාසලක සිසුන් කළ පැමිණිලිවලිනි. මෙම නඩුවේ දී ක්‍රියාවේ " අස්වාභාවිකත්වය" යළි වතාවක් මූලිකව වැදගත් කරුණ බවට පත් විය. "පහර දීමක් (ඇතැම් විට ප්‍රචණ්ඩ පහර දීමක් විය හැකි ය) සිදුව තිබෙන්නේ ය යන කරුණ උසාවිය සැලකුවේ ද්විතීයික වැදගත්කමක් ඇති දෙයක් ලෙස ය.

***ඉන්දියානු සංගමයට සහ වෙනත් අයට එරෙහිව සක්ෂි*** [21] නඩුවේ දී උසාවිය දණ්ඩ නීති සංග්‍රහයේ ඇතුළත් ලිංගික අපයෝජනය සහ සාපරාධී ලිංගික ක්‍රියාකාරකම් සම්බන්ධ නොයෙක් වගන්ති විමසා බැලී ය. 377 වන වගන්තියෙන් අදහස් කෙරෙන්නේ ස්ත්‍රී දූෂණ නඩු පිළිබඳව අවධානය යොමු කිරීම නොවෙතත් එය ස්ත්‍රී දූෂණ නඩුවල දී භාවිතයට ගැනීම පිළිබඳව පෙත්සම්කරුවා අභියෝග කළේ ය. ස්ත්‍රී දූෂණය ඔප්පු කිරීම සඳහා ගාහනය පමණක් වුව ප්‍රමාණවත් ය යන පැහැදිලි කිරීමට ද පෙත්සම්කරුවා අභියෝග කළේ ය. උසාවිය 377 වගන්තියේ අවශ්‍යතාව පිළිගත් අතර දුරාචාරවත් සහ අස්වාභාවික ලිංගික ක්‍රියාකාරකම් අවම කිරීමේ අවශ්‍යතාව විස්තරාත්මකව පැහැදිලි කළේ ය.

---

[17] Fazal Rab Choudhary vs. State of Bihar AIR 1983 (SC) 323.
[18] Pooran Ram vs. State of Rajasthan 2001 CriLJ 91.
[19] Mihir vs. State of Orissa, 1992 CriLJ 488.
[20] 1992 CriLJ 1352
[21] AIR 2004 SC 3566.

***දිල්ලි මධ්‍යම රජයට එරෙහිව නාස් පදනම*** [22] නඩුවේ දී උසාවිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමානතා විධිවිධාන පිළිබඳව ප්‍රගතිශීලී අර්ථ දැක්වීමක් කළ අතර, ව්‍යවස්ථානුකූල සදාචාරය මහජන සදාචාරයට වඩා උත්තරීතර ය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය මහජන සදාචාරය පදනම් කර ගෙන කිසිදු කණ්ඩායමකට වෙනස්කම් නොකරන බව සහතික කළ යුතු ය යන ස්ථාවරය ගත්තේ ය. 377 වන වගන්තිය සියලු පුරවැසියන් ආරක්ෂා කිරීමට අපේක්ෂා කරන ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධ බව උසාවිය ප්‍රකාශ කළේ ය. 377 වන වගන්තිය එල්ජීබීටී ප්‍රජාවට එරෙහි බරපතළ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට හේතු වන බවත්, සෞඛ්‍ය රැකවරණය සලසා ගැනීමේ දී සහ එස්ටීඩී රෝග සම්ප්‍රේෂණය වළක්වා ගැනීමේ දී ඔවුන්ට බාධා කරන බවත් එය පිළිගත්තේ ය.

***හම්සුට එරෙහිව රාජ්‍යය*** [23] නඩුවේ දී අවධානය යොමු වූයේ විත්තිකරුවා ළමයෙකු ලිංගිකව අපයෝජනය කොට පසුව ඔහු මරා දැමීමේ සිද්ධියක් පිළිබඳව ය. නාස් නඩු තීන්දුවෙන් පසුව උසාවිය අපරාධයේ අස්වාභාවිකත්වය පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීම්වලට නොගියේ ය හෝ අනෙක් විනිශ්චයන්හි දී කළ අයුරින් මෛථුනය අර්ථ නිරූපණය නොකළේ ය යන්න මෙහි ලා සඳහන් කළ යුතු වැදගත් කරුණකි. නඩුවේ අවධානය යොමු වූයේ ළමයා අපයෝජනයට ලක් කිරීම සහ මිය යාම පිළිබඳව ය.

කෙසේ වුව ද ***නොදන්නා පුද්ගලයෙකුට එරෙහිව දිනේෂ්බායි*** [24] නඩුවේ දී අවධානය යොමු වූයේ, 377 වන වගන්තිය යටතේ තහනම් වන 'නානාවිධ විකෘත ලිංගික ක්‍රියාවන්' ලෙස විනිශ්චයකරුවා විස්තර කළ දෙය පිළිබඳව ය. නාස් තීන්දුව පිළිබඳව සඳහන් කළ උසාවිය, මෙම නඩුවේ දී මෙන් සහමතියක් නොමැති අවස්ථාවක වුව, නීතියෙන් කියැවෙන තෙක් 377 වන වගන්තිය අදාළ වන්නේ ය යන ස්ථාවරයට එළඹිණ.

**පාකිස්ථානය -**

සාපරාධිත්වය පිළිබඳව පකිස්ථානය සතුව තිබෙන්නේ ද දණ්ඩ නීති සංග්‍රහය යටතේ පැනවුණු මීට සමාන විජිතවාදී විග්‍රහයකි. පකිස්ථාන දණ්ඩ නීති සංග්‍රහයේ 377 වන වගන්තිය 'ස්වභාව ධර්මයේ නියමයට පටහැණිව යන මෛථුනය' සාපරාධී කරයි. මෙය ඉන්දියාවේ විධිවිධානයට සමාන ය. කෙසේ වුව ද මෑත වසරවල ඇතැම් අවස්ථාවල දී පකිස්ථාන උසාවි ප්‍රගතිශීලී ස්ථාවරයක් ගෙන ඇත. තීන්දු කිහිපයකින් පකිස්ථානය තුළ සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී ප්‍රජාවේ අයිතිවාසිකම් ආරක්ෂා කර ඇත.[25] පොලීසිය කරන අඩන්තේට්ටම් පිළිගත් උසාවිය සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී පුද්ගලයන්ට එරෙහිව ගොනු කෙරෙන සියලු නඩු උසාවිය වෙත යොමු කළ යුතු යැයි නියෝග කළේ ය. නොමිලේ සෞඛ්‍ය රැකවරණය සහ උරුමය සඳහා ඇති අයිතිය සහතික කිරීමට ද පියවර ගත යුතු යැයි උසාවිය නියෝග කළේ ය. ෂාසිනා සහ ෂුමායිල් නඩුවේ දී උසාවිය ස්ත්‍රී-පුරුෂ භාවය තෝරා ගැනීමට සහ එය ප්‍රකාශයට

[22] *Naz Foundation v. Govt. of NCT of Delhi*, 160 Delhi Law Times 277 (Delhi High Court 2009).
[23] Death Sentence Ref.No. 5 of 2009.
[24] APPEAL No. 1111 of 2003.
[25] http://www.startribune.com/templates/Print_This_Story?sid=83740347

පත් කිරීමට පකිස්ථානයේ පුරවැසියන්ට ඇති අයිතිය ආරක්ෂා කළේ ය. ශ්‍රේෂ්ඨාධිකරණය බොරු සාක්ෂි දීම සම්බන්ධයෙන් ෂුමායිල් නිදහස් කළේ ය. ෂුමායිල් තම ස්ත්‍රී-පුරුෂ භාවය සම්බන්ධයෙන් උසාවියට බොරු කී බවට මහාධිකරණය චෝදනාවක් ගොනු කොට තිබිණ.[26]

**නේපාලය -**

සුනිල් බාබු පන්ත් නඩුවේ දී[27] නේපාල ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්දේශය වූයේ ලිංගික නැඹුරුව සහ ලිංගික අනන්‍යතාව පදනම් කර ගෙන කරන වෙනස්කම් කිරීම් අවසන් කිරීමට රජය පියවර ගත යුතු බව යි. එහෙත්, වෙනස්කම් කිරීමෙන් ආරක්ෂා වීම සඳහා අවශ්‍ය කරන නීතිමය රැකවරණයන් හඳුන්වා දීමට තව මත් පියවර ගෙන නැත. කෙසේ වුව ද, ලිංගික නැඹුරුව සහ ලිංගික අනන්‍යතාව පදනම් කර ගෙන වෙනස්කම් නොකිරීම පිළිබඳ සහතික වීම් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඇතුළත් කළ යුතු යැයි යෝජනා කර ඇත.

## *365/365ඒ හරහා පුද්ගලයන් වරදකරුවන් කිරීම පිළිබඳ සුදුසු නීතිමය ක්‍රියා පටිපාටිය කුමක් ද?*

අපරාධ නඩු විධාන සංග්‍රහයේ පළමු වන උපලේඛනයේ දී නීතිය දණ්ඩ නීති සංග්‍රහය යටතේ අපරාධ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාවලිය නියම කරයි.

| ***වගන්තිය*** | ***අපරාධ*** | ***සාම නිලධාරියාට වරෙන්තුවකින් තොරව අත් අඩංගුවට ගැනීමක් කළ හැකි ද*** | ***පළමු අවස්ථාවේ දී ම වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද*** | ***ඇප දිය හැකි ද/ නොහැකි ද*** | ***සමථයකට පත් කළ හැකි ද/නොහැකි ද*** | ***දණ්ඩ නීති සංග්‍රහය යටතේ පැනවෙන දඬුවම*** | ***අධිකරණ වසම*** |
|---|---|---|---|---|---|---|---|
| *365* | *අස්වාභාවික අපරාධ* | *වරෙන්තුවකින් තොරව අත් අඩංගුවට ගත හැකි ය* | *වරෙන්තුව* | *ඇප දිය නොහැකි ය* | *සමථයකට පත් කළ නොහැකි ය* | *10 වසරක සාමාන්‍ය හෝ බරපතළ සිර දඬුවමක් සහ දඩයක්, ඊට අමතරව කස පහර* | *මහේස්ත්‍රාත් උසාවිය* |
| *365ඒ* | *තදබල අශෝභන ක්‍රියා* | *වරෙන්තුවකින් තොරව අත් අඩංගුවට ගත හැකි ය* | *වරෙන්තුව* | *ඇප දිය නොහැකි ය* | *සමථයකට පත් කළ නොහැකි ය* | *වසර 2ක් දක්වා සිර දඬුවමක් හෝ දඩයක් හෝ දෙක ම, ඊට අමතරව කස පහර* | *මහේස්ත්‍රාත් උසාවිය* |

[26] තම පියයරු සහ ගර්භාෂය ඉවත් කිරීමේ සැත්කමකින් පසුව ෂුමයිල් රාජ් සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී පුද්ගලයෙකු ලෙස වසර 16ක් ජීවත් වී ඇත.

[27] Sunil Babu Pant and others v Nepal Government and others 2 NJA L.J.[2008] 261-286 http://www.njanepal.org.np/Anex_2.pdf.

සාමය පවත්වා ගැනීමේ සහ සාපරාධී ක්‍රියාකාරකම් සිදු නොවන බව සහතික කිරීමේ කර්තව්‍යය පොලිස් බලකායට පවරා ඇත. අනතුරුව, අපරාධයක් වැළැක්වීම සඳහා පොලීසිය බල ගන්වනු ලැබේ. එම නිසා, සාපරාධී ක්‍රියාකාරකම්වල යෙදී සිටින්නේ යැයි තමන් සලකන ඕනෑ ම පුද්ගලයෙකු අත් අඩංගුවට ගැනීමට පොලීසියට හැකි ය. 365 සහ 365ඒ සම්බන්ධයෙන් ගත් විට, වගන්තිය යටතේ පුද්ගලයෙකුට චෝදනා කිරීම සඳහා පිළිබඳ 'කාමුක සංසර්ගය' හෝ '*තදබල අශෝභන* ක්‍රියාව' සාක්ෂි පැවතිය යුතු අතර, බොහෝ අවස්ථාවල දී අප දකින්නේ අත් අඩංගුවට ගැනීමේ දී පොලීසිය එය කරන්නේ අනාගතයේ දී සාපරාධී ක්‍රියාව කිරීමට නියමිත යැයි ප්‍රකාශ කරමින් ස්ත්‍රී-පුරුෂ ක්‍රියාකාරීත්වය පදනම් කර ගෙන ය.[28] කෙසේ වුව ද, කලින් ප්‍රකාශ කරන ලද පරිදි, අත් අඩංගුවට ගත්තවුන්ට එරෙහිව කිසිදු චෝදනාවක් ගොනු කොට හෝ ඔවුන් අධිකරණයට ඉදිරියට පමුණුවා හෝ නොමැත. මෙම අත් අඩංගුවට ගැනීම්වලින් බොහොමයක් අල්ලස් ගැනීමෙන්, අවමාන තර්ජනවලින්/ත්‍රාසාද්ග්‍රහණයෙන්, ප්‍රචණ්ඩත්වයෙන් සහ බලාත්කාරී ලිංගික අනුග්‍රහ දැක්වීම්වලින් අවසන් වෙයි.

පළමු වන උපලේඛනයේ දී අප දකින පරිදි, වරෙන්තුවකින් තොරව අත් අඩංගුවට ගත හැකි නමුදු විත්තිකරුවා මහේස්ත්‍රාත් උසාවියට කැඳවීමට පෙර වරෙන්තුවක් නිකුත් කළ යුතු ය. පුද්ගලයෙකු අත් අඩංගුවට ගත් විට සහායක සාක්ෂි සහිතව චෝදනා ගොනු කළ යුතු අතර, චූදිතයා මහේස්ත්‍රාත්වරයා හමුවට පැමිණවිය යුතු ය. 365 සහ 365ඒ වගන්ති යටතේ, අපරාධය රාජ්‍යයට එරෙහි අපරාධයක් ලෙස සැලකෙන නිසා උසාවියෙන් පිටත දී යම් සමථයකට පැමිණීමට අදාළ පාර්ශ්වයන්ට නොහැකි ය.

## *ශ්‍රී ලංකාවේ LGBT පුද්ගලයන් වරදකරුවන් කිරීම සඳහා යොදා ගෙන ඇති වෙනත් නීතිමය විධිවිධාන මොනවා ද?*

LGBT පුද්ගලයන්ට අඩන්තේට්ටම් කිරීම, ඔවුන් තැති ගැන්වීම සහ ඔවුන් අත් අඩංගුවට ගැනීම සඳහා, 365 සහ 365ඒ වගන්ති හැරුණු විට වෙනත් නීති කිහිපයක් ද යොදා ගෙන ඇත.

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ ***352 වන වගන්තිය*** අවධානය යොමු කරන්නේ නීත්‍යානුකූල භාරකාරත්වයෙන් බාලවයස්කාරයෙකු ඩැහැ ගැනීම හෝ ඉවත් කර ගැනීම පිළිබඳව ය.[29] තම නිවෙස් හැර ගිය සමලිංගික කාන්තාවන්ට එරෙහිව මෙම වගන්තිය ඇතැම් අවස්ථාවල යොදා ගෙන ඇත. විශේෂයෙන් ම කාන්තාවන් දෙදෙනාගෙන් එක් අයෙකු වයස 18ට අඩු අවස්ථාවල යුවළ බිය ගැන්වීම සඳහා මෙය යොදා ගැනීමට පොලීසියට හැකි වී ඇත. මෙම කාන්තාවන් වැඩිහිටි වයසේ පසු වන්නන් වූ විට ද ඔවුන්ට තම නිවෙස් කරා ආපසු යන ලෙස පොලීසිය බල කළ අවස්ථා ඇත. විවාහ වූ විට පමණක් කාන්තාවන්ට තම උපන් නිවස හැර යාමට ඉඩ සලසන සමාජ සංස්කෘතික විශ්වාසයන් සහ

[28] ප්‍රසිද්ධ ස්ථානයක සිටියේ ය යන කරුණ පමණක් පදනම් කර ගෙන සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී පුද්ගලයන් අත් අඩංගුවට ගන්නා අවස්ථාවල දී අපි මෙය දකිමු. අත් අඩංගුවට ගැනීමේ දී පොලීසිය ඊට හේතු වශයෙන් දක්වන්නේ තදබල අශෝභන ක්‍රියා වැළැක්වීම සඳහා ය යන්න බව සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් සොයා ගැනුණි.
[29] 352 වන වගන්තිය, දණ්ඩ නීති සංග්‍රහය, ශ්‍රී ලංකාව.

පරිචයන් අනුව යමින් ප්‍රජාගණවාදීව පාලනය කිරීමක් සහ කාන්තාවන්ගේ ජීවිත පාලනය කිරීමක් ලෙස මෙය හැඳින්විය හැකි ය.

***353 වන වගන්තිය*** පැහැර ගෙන යාම පිළිබඳව ය. එය පැහැර ගෙන යාම නිර්වචනය කරන්නේ 'කවුරුන් හෝ කිසි යම් ස්ථානයකින් ඉවත්ව යාමට පුද්ගලයෙකු *බලාත්කාරයෙන්* යොමු කිරීම හෝ වංචනික උපක්‍රමයකින් හෝ බලය අයුතු ලෙස යොදා ගැනීමෙන් හෝ වෙන යම් උපක්‍රමයකින් පෙලඹවීම' ලෙස ය. මෙම වගන්තිය ද මූලික වශයෙන් යොදා ගෙන ඇත්තේ කාන්තාවන් තම නිවෙස්වලින් පලා ගිය අවස්ථාවල දී ය.[30]

***අනාචාරයේ හැසිරීම පිළිබඳ ආඥා පනත***[31] 'අශික්ෂිත, නොහික්මුණු ආකාරයෙන්' හැසිරෙන සෑම පුද්ගලයෙකු ම, අවිනීත ආකාරයෙන් ක්‍රියා කරන 'ගණිකාවන්' ඉවසා සිටින සහ ඔවුන්ට දඬුවම් කරන සෑම අයෙකු ම අපරාධකරුවෙකු බවට පත් කරයි.[32] මෙම වගන්තිය යටතේ LGBT පුද්ගලයන්, විශේෂයෙන් ම සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී පුද්ගලයන් අත් අඩංගුවට ගෙන ඇති අතර, කලින් සඳහන් කළ පරිදි ඔවුන් අඩන්තේට්ටම්වලට, පරිහාසයට මුහුණ දී ඇත. එමෙන් ම, නිදහස් වීම සඳහා අල්ලස් දීමට බල කර ඇත.[33]

| ***වගන්තිය*** | ***අපරාධ*** | ***පොලිස් නිලධාරියාට වරෙන්තුවකින් තොරව අත් අඩංගුවට ගැනීමක් කළ හැකි ද*** | ***පළමු අවස්ථාවේ දී ම වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද*** | ***ඇප දිය හැකි ද/ඇප දිය නොහැකි ද*** | ***සමථයකට පත් කළ හැකි ද/නොහැකි ද*** | ***දණ්ඩ නීති සංග්‍රය යටතේ පැනවෙන දඬුවම*** | ***අධිකරණ වසම*** |
|---|---|---|---|---|---|---|---|
| 353/354 | පැහැර ගෙන යාම/පැහැර ගෙන ගොස් රඳවා තබා ගැනීම | වරෙන්තුවකින් තොරව අත් අඩංගුවට ගත හැකිය | වරෙන්තුව | ඇප දිය නොහැකි ය | සමථයකට පත් කළ නොහැකි ය | 7 වසරක සිර දඬුවමක් සහ දඩයක් | මහේස්ත්‍රාත් උසාවිය |

30 සම්මුඛ සාකච්ඡාවට ලක් කළ සමලිංගික කාන්තාවන් තිදෙනෙකු ප්‍රකාශ කළේ, පැහැර ගෙන යාම සහ පැහැර ගෙන ගොස් රඳවා තබා ගැනීම පිළිබඳව තම සහකාරියට චෝදනා කරමින් තම පවුල්වල සාමාජිකයන් 353 වන වගන්තිය යටතේ පැමිණිල්ලක් ගොනු කර ඇති බව යි. මෙම සිදුවීම්වලින් බොහොමයක දී, පොලීසිය උසාවියේ කාර්ය භාරය භාර ගෙන ගත යුතු පියවර තීන්දු කර ඇත. බොහෝ අවස්ථාවල දී, තම නිවෙස් කරා ආපසු යන ලෙස කාන්තාවන්ට බල කර ඇත.

31 The Vagrants Ordinance, http://www1.umn.edu/humanrts/research/srilanka/statutes/Vagrants_Ordinance.pdf

32 අයාලේ යාම පිළිබඳ ආඥා පනතේ 2 වන සහ 3 වන වගන්ති.

33 සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී පුද්ගලයන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා.

## *1886 සිට පවතින මෙම වගන්ති දෙකෙන් ඇති විය හැකි බලපෑම්*

365 සහ 365ඒ වගන්තිවල බලපෑම් බොහෝ ය. LGBT පුද්ගලයන්ට චෝදනා ඉදිරිපත් කිරීම සඳහා LGBT මෙම නීතිය යොදා ගෙන නැති වුව ද, LGBT විය හැකි ප්‍රජාව ඉලක්ක කර ගැනීමේ සහ ඔවුන්ට අඩන්තේට්ටම් කිරීමේ මෙවලමක් ලෙස එය යොදා ගෙන ඇති අතර, ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස ඔවුන් භුක්ති විඳින ව්‍යවස්ථාපිත සහ මූලික අයිතිවාසිකම් කිහිපයක් උල්ලංඝනය වීමට තුඩු දී ඇත. රාජ්‍යයේ සුභසාධන පියවරයන්ගෙන් ප්‍රයෝජන ලැබීමට පවා නොහැකි දෙවන ගණයේ පුද්ගලයන් ලෙස ජීවත් වීමට LGBT ප්‍රජාවට බල කර ඇත. පහත දැක්වෙන කොටස්වල දී, මෙම වාර්තාව මෙම වගන්ති දෙකෙන් LGBT පුද්ගලයන්ගේ ජීවිත කෙරෙහි ඇති විය හැකි බලපෑම් සටහන් කරයි.

- ***නීතිය මාර්ගයෙන් අඩන්තේට්ටම් කිරීම*** - ශ්‍රී ලංකාව තුළ, 2012 නොවැම්බර් මාසය තෙක්, 365ඒ වගන්තිය යටතේ කොටුව දුම්රිය පොළේ දී වැඩිහිටියන් දෙදෙනෙකු අත් අඩංගුවට ගැනීම හැරුණු විට, වැඩිහිටියන් සම්බන්ධයෙන් මෙම වගන්තිය යටතේ වෙනත් කිසිදු සිදුවීමක් වාර්තා වී නැත. ඉන්දියාවේ ගුප්තා කළ අධ්‍යයනයෙන් උකහා ගෙන අපට කිව හැක්කේ, මෙම වගන්තිය යටතේ ගොනු කෙරුණු නඩුවලින් බොහොමයක් ළමා ලිංගික අපයෝජනය හෝ වැඩිහිටියන් අතර ස්වකැමැත්ත ඇතිව සිදුවන ලිංගික ක්‍රියා සම්බන්ධයෙන් බව යි.[34] පූර්ව නඩු තීන්දුවලින් තහවුරු වුණු නීති නොමැති වීමට හේතුව නම්, පෞද්ගලික ක්ෂේත්‍රයේ දී 'කායික' සංසර්ගය යනු ස්වභාව ධර්මයේ නියමයට එරෙහිව යාමක් යැයි ඔප්පු කළ නොහැකි වීම යි. කෙසේ වුව ද මෙහි බලපෑම වී තිබෙන්නේ, ප්‍රසිද්ධ ක්ෂේත්‍රයේ දී ලිංගික ක්‍රියාකාරකම් ප්‍රකාශයට පත් වූ විට පොලීසිය සහ වෙනත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් LGBT පුද්ගලයන්ට අඩන්තේට්ටම් කිරීම යි. LGBT ප්‍රජාවට සාකල්‍ය රැකවරණයක් ලැබීමට නම් අඩන්තේට්ටම් කිරීම්වල විවිධත්වය ද සහිතව ඒවා අවබෝධ කර ගත යුතු වේ. ජීබීටී පිරිමින් නීතිය සමග පොර බදන්නේ එල්ජීබීටී කාන්තාවන්ට වඩා සැලකිය යුතු ලෙස වෙනස් ආකාරයකිනි. 'පිරිමින්' සම්බන්ධයෙන් ගත් කල, නීතිය සමග සිදු වන ගැටුමේ වැඩි කොටස සිදු වන්නේ ප්‍රසිද්ධ ක්ෂේත්‍රයෙහි ය. එල්ජීබීටී කාන්තාවන් සම්බන්ධයෙන් ගත් කල, මෙම අඩන්තේට්ටම් කිරීම සිදු වන්නේ පෞද්ගලික සහ ප්‍රජා මට්ටමේ දී ය. සමලිංගික පුරුෂයන් සහ සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී පුද්ගලයන් තම පවුල්වලින් කෙරෙන අඩන්තේට්ටම්වලට මුහුණ නොපාන බවත්, ඒ වෙනුවට LGBT ප්‍රජාවේ නොයෙක් කොටස් මුහුණ පාන අඩන්තේට්ටම්වල පවත්නා සියුම් වෙනස්කම් අවබෝධ කර ගත යුතු බවත් කිව යුතු නො වේ.

[34] ගුප්තා. ඒ. 377 වන වගන්තිය සහ ඉන්දියානු සමලිංගිකයන්ගේ අභිමානය. Economic and Political Weekly. 2006 නොවැම්බර් 18. ඉන්දියානු උසාවිවල ගොනු කෙරුණු නඩු 50ක් පිළිබඳව ගුප්තා තර්ක කරන අතර, ඉන් 30%ක් ලිංගික අඩන්තේට්ටම්, ළමා ලිංගික අපයෝජනය සහ වැඩිහිටියන් අතර ස්වකැමැත්ත ඇතිව සිදුවන ලිංගික ක්‍රියා සම්බන්ධයෙනි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, එක ම ලිංගයට අයත් වැඩිහිටියන් අතර ස්වකැමැත්ත ඇතිව සිදුවන ලිංගික ක්‍රියාවලට අදාළව එක ද නඩුවක් හෝ වාර්තා වී නැත.

LGBT ප්‍රජාව සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා පිළිබඳව කෙටි විශ්ලේෂණයක් කළ විට පෙනී යන්නේ, සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී පුද්ගලයන් සහ විරුද්ධ ලිංගිකයන්ගේ ඇඳුම් පැලඳුම් අඳින පලඳින්නන් නිරතුරුව පොලීසියේ අඩන්තේට්ටම්වලට මුහුණ පාන බව යි.[35] අල්ලස් දීමට ඔවුන්ට බල කෙරෙන අතර, අවස්ථා කිහිපයක දී, අත් අඩංගුවට නොගැනීමට නම් ලිංගික අනුග්‍රහ දැක්වීමට බල කෙරී ඇත. කායික සංසර්ගයක් පිළිබඳව කිසිදු සාක්ෂියක් නැති අවස්ථා සම්බන්ධයෙන් පවා, සියලු ලිංගික ක්‍රියා අයත් වන පරිදි සහ සෑම අවස්ථාවක දී ම ප්‍රසිද්ධ ක්ෂේත්‍රයට පිවිසෙන සාපරාධිත්වය පිළිබඳ විවරණයක් 365 සහ 365ඒ වගන්තිවලින් නිර්මාණය වේ. 'සමලිංගිකතා' පෙනුම සහ 'කාමුක සංසර්ගයේ' යෙදීමට ඉඩ තිබීම' සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී පුද්ගලයන්ට අඩන්තේට්ටම් කිරීමට, ඔවුන් අත් අඩංගුවට ගැනීමට සහ ඔවුන් අපයෝජනයට ලක් කිරීමට පොලීසියට බලයක් ලබා දෙයි. එබැවින්, ක්‍රියාව සාපරාධී වුව ද, සම්මත ස්ත්‍රී-පුරුෂ කාර්යභාරයන්ට අනුකූලව කටයුතු නොකරන්නන්ගේ සිරුරු මත නීති විරෝධිත්වය සලකුණු වී තිබෙන බව අපට පෙනේ.

එල්ජීබීටී කාන්තාවන් සම්බන්ධයෙන් ගත් කල, දෙපාර්ශ්වය ම වැඩිහිටියන් වුව ද කාන්තාවගේ සහකාරියට එරෙහිව පැහැර ගෙන ගොස් රඳවා තබා ගැනීම පිළිබඳව චෝදනා ගොනු කිරීමට පවුල් යොමු වූ අවස්ථා කිහිපයක් ඇත. කෙසේ වුව ද, මෙම නඩු අවසානයක් දක්වා ගෙන නොගිය අතර චෝදනා ඉවත් කර ගෙන ඇත.[36] කෙසේ වුව ද, අඩන්තේට්ටම් කිරීම සහ බලාත්කාරකම් පෑම සඳහා පැහැර ගෙන ගොස් රඳවා තබා ගැනීම පිළිබඳ චෝදනා යොදා ගෙන ඇත.[37] එහෙත් ඉන්දියාවේ දී නම්, එල්ජීබීටී කාන්තාවන්ට එරෙහිව හබයාස් කෝපුස් ආඥා යොදා නොගැනේ.[38] ස්ත්‍රී-පුරුෂ භාවය පිළිබඳ සිරිත් පවත්වා ගෙන යාම සඳහා සහ විකල්ප ලිංගිකත්වය ප්‍රකාශයට පත් වීම් මර්දනය කිරීම සඳහා නීතිය සමග අත්වැල් බැඳ ගන්නා මව්පිය, වාර්ගික සහ සංස්කෘතික මුර කිරීම් පිළිබඳව තම්බයියා කතා කරයි.[39]

---

35 සම්මුඛ සාකච්ඡාවට ලක් කළ සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී පුද්ගලයෝ සියලු දෙනා ම (100%ක්) අඩන්තේට්ටම් කිරීම සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳව පැමිණිලි කළහ.


36 කොළඹ වෙසෙන සමලිංගික ස්ත්‍රියක සමග කළ සම්මුඛ සාකච්ඡාවකි.

37 The Status of Lesbians, Bisexual Women and Transgendered Persons in Sri Lanka; NGO Shadow Report to the Committee on the Elimination of All Forms of Discrimination Against Women at http://www2.ohchr.org/english/bodies/cedaw/docs/ngos/WSG_SriLanka48.pdf


38 Arasu. P, Thangarajah. P. Queer women and Habeas Corpus in India: The love that blinds the law. *Indian Journal of Gender Studies*, 19, 3 (2012) 413-435

39 Tambiah, Man-made laws and feminine feelings: A lesbian encounter with the law in Sri Lanka; *Lines Magazine*, May 2003 accessed on 13/01/2013 at http://issues.lines-magazine.org/Art_May03/yasmin.htm


**LGBT පුද්ගලයන් මුහුණ පාන පොලිස් ප්‍රචණ්ඩත්වය**




**365 සහ 365ඒ පිළිබඳව පොලීසියේ මතය**



**365 සහ 365ඒ පිළිබඳව නීතිඥයන්ගේ මතය**




- ***අසමාන පුරවැසිකම*** - අපරාධකාරයන් බවට පත් කිරීම සහ වෙනස්කම් කිරීම නිසා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කෙරෙන මූලික අයිතිවාසිකම් අත් කර ගැනීමට සහ භුක්ති විඳීමට LGBT පුද්ගලයන් අසමත් ය. සමසෙනෙහස් ස්ත්‍රියක, සමසෙනෙහස් පුරුෂයෙකු, දෙපාර්ශවයටම ආදරය කරන පුද්ගලයකු හෝ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු ලෙස විවෘතව පෙනී සිටින අයෙකු  අදහස් පළ කිරීමේ නිදහස හෝ වෙන යම් මූලික අයිතිවාසිකමක් සම්බන්ධයෙන් එක ද නඩුවක් හෝ ගොනු කර නොතිබීම සැලකිය යුතු කරුණකි.[40] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වාටියෙහි එල්ලී ජීවත් වීමට LGBT පුද්ගලයන්ට බල කෙරේ. ස්ත්‍රී-පුරුෂ භාවය, ආගම, ජනවාර්ගිකත්වය හෝ කුලය පදනම් කර ගත් කිසිදු වෙනස්කම් කිරීමක් නොපැවතිය යුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැහැදිලිව ප්‍රකාශ කරතත්, ලිංගික නැඹුරුව ඊට ඇතුළත් කර නැත. LGBT පුද්ගලයෙකුට රැකවරණය සැලසෙන්නේ ඔහු/ඇය විරුද්ධ විෂමලිංගික-සම්මත ක්‍රියාකාරිත්වයක් පවත්වා ගෙන යන්නේ නම් පමණකි. උදාහරණයක් ලෙස, බොහෝ LGBT පුද්ගලයන් කම්කරු ආරාවුල් විසඳා ගැනීම සඳහා කම්කරු විනිශ්චය සභා වෙත එළඹෙන අතර, කම්කරු උසාවිය ලිංගික නැඹුරුව පනම් කර ගෙන නඩුවක් අසාධාරණ ලෙස ඉවත දැමූ එක ද අවස්ථාවක් හෝ නොමැති ය යන්න සඳහන් කළ යුතු වැදගත් කරුණකි.

[40] සම්මුඛ සාකච්ඡාවට ලක් කළ රාජ්‍ය නොවන සංවිධාන 13න් 78%ක් ම මානව අයිතිවාසිකම් සංවිධාන වුවත්, ඒවා සතුව ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පදනම් කර ගත් අංශ පැවතියත්, එල්ජීබීටී පුද්ගලයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියා කර තිබුණේ නැත. බොහෝ සංවිධාන එල්ජීබීටී පුද්ගලයන් මුහුණ පාන ප්‍රචණ්ඩත්වය අයිතිවාසිකම් උල්ලංඝනයක් ලෙස සැලකුවේ ද නැත. වෙනත් මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ පැමිණිලි ගොනු කර ඇත්තේ තමන් සමලිංගිකයන් ලෙස ප්‍රසිද්ධියේ හඳුන්වා නොදෙන සමලිංගික පුද්ගපයන් විය හැකි ය යන කරුණ මින් බැහැර නො වේ. කෙසේ වුව ද, මෙම හඳුන්වා නොදීමෙන් සංකේතවත් වන්නේ සමලිංගික පුද්ගලයන් මුහුණ පාන භීතිය සහ අපකීර්තිය යි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අදහස් පළ කිරීමේ නිදහස සහතික කෙරෙතත්, විරුද්ධ ලිංගික ඇඳුම්පැලඳුම් අඳිනපලඳින පුද්ගලයෝ සහ සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී පුද්ගලයෝ තමන් තෝරා ගත් ස්ත්‍රී-පුරුෂ ප්‍රකාශන විධි හේතු කොට ගෙන නිරතුරුව අඩන්තේට්ටම්වලට මුහුණ පාති. 'වෙස් වළා ගැනීම' සහ 'සාවද්‍ය අර්ථ නිරූපණය' සම්බන්ධයෙන් අධිකරණය හමුවට පමුණුවන ලද අතීත සිදුවීම් කිහිපයක් පවතී. ඒවායේ දී, පිරිමින් ලෙස වෙස් වළා ගත් කාන්තාවන් 'අනාවරණය වී' ඔවුන්ගේ 'සැබෑ ලිංගික අනන්‍යතාව' ජනතාව හමුවේ එළිදරව් විය. මේ අයුරින් ම, 'ජනතාව නොමග යැවීම' සම්බන්ධයෙන් සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී කාන්තාවන් ද අත් අඩංගුවට ගෙන ඇත.[41]

කෙසේ වුව ද, මාධ්‍යය ක්‍රියා කර ඇත්තේ LGBT පුද්ගලයන්ට එරෙහිව වෛරී සහගතව කෙරෙන කතාවලට නීත්‍යනුකූලත්වය සහ සහාය පිරිනැමීමට ය. 2000 ජූනි මාසයේ දී, දේශීය දිනපතා ප්‍රකාශනයක් වන *අයිලන්ඩ්* පුවත්පතෙහි පළ වූ ලියුමකට පුවත්පත් මණ්ඩලය සිය සහාය පළ කළේ, සමලිංගික ස්ත්‍රී ගැටලු පිළිබඳව පැවැත්විය යුතු බවට යෝජනා කෙරෙන සම්මේලනයේ දී චූදිත ස්ත්‍රී දූෂකයන් හෙළිදරව් කළ යුතු බවත් ඉල්ලා සිටිමිනි.[42] මණ්ඩලයේ තීරණයෙන් මෙසේ කරුණු ගෙන හැර දැක්විණ: "... ස්ත්‍රී සමලිංගිකතාව යනු පරපීඩාකාමී ක්‍රියාවක් වන අතර, ලිංගික කාරණා පිළිබඳව අනිසි උනන්දුවක් ඇති වන ආකාරයෙන් එවැනි ක්‍රියාකාරකම්වලට එරෙහිව කිසි යම් මතයක් ප්‍රකාශයට පත් කිරීම පරපීඩාකාමීත්වයට හෝ සල්ලාලකමට අනුබල දීමක් නොවන නමුත් එවැනි කල්ක්‍රියාවන්ට සහාය දෙන කිසි යම් ප්‍රකාශනයක් කරන්නේ ඒ ආකාරයේ ප්‍රචණ්ඩත්වයට, පරපීඩාකාමීත්වයට සහ සල්ලාලකමට නිසැකව ම අනුබල දීමකි." පැමිණිල්ල ගොනු කළ තැනැත්තාට දඩ ගසනු ලැබිණ.[43]

මෑත වසරවල දී සමලිංගික පුරුෂයන් කිහිප දෙනෙකු ශ්‍රී ලංකාවෙන් පලා ගොස් ඇති අතර, වර්තමානයේ දී ඔවුහු ශ්‍රී ලංකාවට ආපසු ගිය හොත් තමන් හිංසනයට ලක් වන්නේ ය යන පදනම මත ඇමරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය ඇතුළු වෙනත් රටවල රැකවරණය ලබා ගැනීමට උත්සාහ කරමින් සිටිති. ශ්‍රී ලංකාවේ නැගෙනහිර මුස්ලිම් සමලිංගික පිරිමි දෙදෙනෙක් ද ඔවුන් අතර සිටිති. තම ලිංගික නැඹුරුව නිසා තමන් පැහැර ගෙන ගොස්, වධබන්ධන පමුණුවා, ඉස්ලාමීය නීතිය යටතේ තම ජීවිත මත තීන්දු පනවා ඇති බවට ඔවුහු චෝදනා කරති. ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනය ද මුස්ලිම් තරුණයෙකු පිළිබඳ මීට සමාන සිදුවීමක් වාර්තා කර ඇත. ඔහු ශ්‍රී ලංකාවේ දකුණේ බේරුවල පිහිටි තම නිවසින් පලා ගියේ තම ලිංගික නැඹුරුව නිසා නිවසට ප්‍රහාරයක් එල්ල වීමෙන් පසුව ය.

41 Women's Support Group, Shadow report; NGO Shadow Report to the Committee on the Elimination of All Forms of Discrimination Against Women, January 2011, accessed on 16/01/2013 at http://www2.ohchr.org/english/bodies/cedaw/docs/ngos/WSG_SriLanka48.pdf


42 P. Alles, "Lesbian Conference in Colombo?" The Island, August 20, 1999.

43 Sri Lanka Press Council, Judgment to Complaint no S2/99/2096, 2000

- ***සෞඛ්‍ය රැකවරණය සලසා ගැනීම*** - බොහෝ රටවල් සමලිංගිකතාව මානසික රෝග ලැයිස්තුවෙන් ඉවත් කර ඇතත්, ශ්‍රී ලංකාව තුළ තව මත් එය සැලකෙන්නේ මානසික රෝගයක් ලෙස ය. 'සමලිංගිකතාවට' ප්‍රතිකාර ලබා දීමේ අපේක්ෂාවෙන් LGBT පුද්ගලයන් මනෝ චිකිත්සකයන් සහ මනෝ විද්‍යාඥයන් වෙත ගෙන ගිය අවස්ථා කිහිපයක් දැනුදු පවතී.[44] මෙය, බරපතළ වෛද්‍ය පර්යේෂණවලට සහ නොසලකා හැරීම්වලට තුඩු දී ඇතිවා පමණක් නො ව, මානසික අවපීඩනයට සහ සිය දිවි නසා ගැනීමට තුඩු දෙමින් LGBT පුද්ගලයන් මත දැවැන්ත මානසික බරක් ද පටවා ඇත. LGBT හිතැති මනෝ චිකිත්සකයන්/මනෝ විද්‍යාඥයන් ප්‍රමාණවත් තරම් නොමැතිකම නිසා LGBT පුද්ගලයන්ට උපදේශනය හෝ මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර සඳහා අවස්ථා සලසා ගැනීමට ද නොහැකි වී ඇත.[45]

LGBT පුද්ගලයන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම මහා පරිමාණයකින් ප්‍රතික්ෂේප කර නැතත්[46], වෙනස්කම් කිරීම පිළිබඳ භීතිය නිසා වෛද්‍යවරුන් වෙත පූර්ණ ලෙස සහ නිසි ලෙස තොරතුරු අනාවරණය කෙරෙන්නේ ද යන්න සැක සහිත බව සඳහන් කළ යුතු ය.

**මානසික සෞඛ්‍ය වෘත්තිකයන්ගේ මතය**




---

[44] සමලිංගිකතාව යනු අසාමාන්‍ය අතකට යොමු වීමක් ලෙස සැලකෙන බවත්, චර්යාමය ප්‍රතිකාර සහ ඇතැම් අවස්ථාවල දී කම්බන ප්‍රතිකාර පවා යොදා ගැනෙන බවත්, සම්මුඛ සාකච්ඡාවට ලක් කළ මානසික සෞඛ්‍ය විශේෂඥයන්ගෙන් 83%ක් ම පිළිගත්හ.

[45] එල්ජීබීටී පුද්ගලයන්ගෙන් 97%ක් ම කැමැත්ත පළ කළේ 'සමලිංගිකයෙකු ලෙස සමාජයට නිරාවරණය වීමේ' දී එනම් පවුල තුළ දී සහ ප්‍රජාව තුළ දී මුහුණ පාන ප්‍රචණ්ඩත්වය සමග පොර බැදීමේ දී උදව් බලාපොරොත්තුවෙන් මනෝ චිකිත්සකයෙකු හෝ මනෝ විද්‍යාඥයෙකු වෙත නොයාමට ය. ඒ අතර, මෙසේ සිදු වන්නේ වෛද්‍යවරුන් ඍණාත්මක ප්‍රතිචාර දැක්විය හැකි ය යන භීතිය නිසා බව 80%ක් ප්‍රකාශ කළහ, 12%ක් තමන් යොමු වුණු වෛද්‍යවරුන් වෙතින් ඍණාත්මක චර්යාවන් සහ අවබෝධයක් නැතිකමක් අත්දැක තිබුණහ.

[46] EQUAL GROUND Stigma index

- ***ළමා ලිංගික අපයෝජනයට එරෙහිව රැකවරණය සැලසීමට අසමත් වීම*** - ළමයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මුල දී ප්‍රබල ප්‍රගතිශීලී පියවරයන් ගනු ලැබුණ ද වර්තමානයේ දක්නට ලැබෙන්නේ පිරිහීමකි. සම්මුඛ සාකච්ඡාවට ලක් කළ පොලිස් නිලධාරීන් ප්‍රකාශ කළේ ළමා ලිංගික අපයෝජනයට එරෙහිව ළමයින්ට රැකවරණය සැලසීම සඳහා 365 සහ 365ඒ වගන්ති යොදා ගන්නා බව යි.[47] එහෙත් නඩු තීන්දු ලබා දීමට වසර ගණනාවක් ගත වන අතර, චෝදනා ඉදිරිපත් කිරීමේ දී ළමයා කේන්ද්‍ර කර ගත් ප්‍රවිෂ්ටයක් ගැනීමට උසාවි අසමත් වෙයි. මෙම වගන්ති යටතේ පැනවෙන දඬුවම් දරුණු වුව ද, දඬුවමේ නියත භාවය පිළිබඳව සහතික වීමට උසාවි ක්‍රමයෙන් අසමත් වි ඇත. මානව හිමිකම් ක්‍රියාකාරීන් නොයෙක් විට තර්ක කර ඇති පරිදි, බොහෝ අපරාධවලට එරෙහි බාධකය වන්නේ දඬුවමේ දරුණුකම නොව නියත භාවය යි. බෙහෙවින් වෙනස් තත්ත්වයන් දෙකක්" අතර, එනම් සිය අකැමැත්තෙන් සිදු වන ලිංගික ක්‍රියාව සහ සිය කැමැත්ත ඇතිව සිදුවන ලිංගික සම්බන්ධතා අතර වෙනස පැහැදිලිව වටහා ගැනීමට උසාවිය අසමත් වීමෙන් ඇඟවෙන්නේ, "යොවුන් පිරිමි ළමයින් දූෂණය කරන හෝ අපයෝජනය කරන වැඩිහිටි පිරිමින්, වෙනත් පිරිමින් බලාත්කාරයෙන් දූෂණය කරන පිරිමින් සහ (සිය කැමැත්තෙන් ලිංගික ක්‍රියාකාරකම්වල නියැළෙන) පිරිමි සමලිංගිකයන්" යන මේ සියලු දෙනා එක සමාන බව යි. "කැමැත්තෙන් සිදුවන විෂමලිංගික හැසිරීම්" සමග සම කළ නොහැකි නිසා සමලිංගික ක්‍රියා පිළිකුල් කටයුතු ක්‍රියාකාරකම් බවට පත් වන අතර, එම නිසා සසඳා බැලිය නොහැකි වේ.[48]

  ශ්‍රී ලංකාව ළමයාගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ප්‍රගතිශීලී නීති කිහිපයක් සම්මත කර ඇති අතර[49], ළමා අපයෝජනය පිළිබඳව රජයට උපදෙස් දීම සඳහා ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය පිහිටුවා බල ගන්වා ඇත.[50] 360ඉ වගන්තිය ප්‍රකාශ කරන්නේ, ලිංගික අපයෝජනය සඳහා ළමයෙකු පොලඹවන කවරෙකුට වුව දස වසරක සිර දඬුවමක් සහිතව දඬුවම් පැමිණිවිය යුතු බව යි.[51] ළමා ලිංගික අපයෝජනය පිළිබඳ නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී 365 සහ 365ඒ

---

[47] සම්මුඛ සාකච්ඡාවට ලක් කළ පොලිස් නිලධාරීන්ගෙන් 80%ක් ප්‍රකාශ කළේ ළමා ලිංගික අපයෝජනයට එරෙහිව 365, 365ඒ වගන්ති යොදා ගන්නා බව යි. ඒ අතර, පොලිස් නිලධාරීන්ගෙන් 50%ක් කල්පනා කළේ ළමා ලිංගික අපයෝජනයට විසඳුම් සෙවීමේ දී මෙම වගන්ති ප්‍රමාණවත් බව යි. පොලිස් නිලධාරීන්ගෙන් 50%ක පිළිගැනීම වූයේ ළමා ලිංගික අපයෝජන නඩුවල දී මෙම වගන්ති යොදා ගැනීමේ අපේක්ෂාවක් නොමැති බව යි.

[48] Gupta. A. Section 377 and the dignity of Indian homosexuals. Economic and Political Weekly. 18 November 2006

[49] 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත, කාන්තාවන් සහ ළමයින් ඇතුළු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ පීඩා විඳින සහ අවදානමට ලක්ව සිටින්නන් ආරක්ෂා කිරීම සඳහා වහා ම රැකවරණ නියෝග ලබා ගැනීමට අවශ්‍ය විධිවිධාන සම්පාදනය කරයි. 2006 අංක 16 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධිත) පනතේ 360සී වගන්තිය, විද්‍යුත් මාධ්‍යයෙන් ද ඇතුළුව කෙරෙන නීති විරෝධී ළමා ජාවාරමට එරෙහි නීතිය ශක්තිමත් කරයි. 2007 අංක 56 දරණ සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (අසීසීපීආර්), ළමයින් සම්බන්ධ සියලු කාරණාවල දී ප්‍රමුඛ වැදගත්කම හිමි විය යුත්තේ ළමයාගේ හොඳ ම යහපත සැලසෙන විසඳුමට යැයි සම්පාදනය කරතත් උදාහරණ වශයෙන් දක්වා ඇත්තේ කිහිපයකි.

[50] National Child Protection Authority Act No. 50 OF 1998 http://www.ilo.org/dyn/natlex/docs/WEBTEXT/52618/65161/E98LKA01.htm

[51] 360ඉ වගන්තියෙන් මෙසේ කියැවේ - (1) ශ්‍රී ලාංකිකයෙකු වේවා ශ්‍රී ලංකාවෙන් පිටස්තරයෙකු වේවා, ළමයෙකු ලිංගික අපයෝජනයට ලක් කිරීමේ අදහස ඇතිව කවර හෝ උපායකින් (අ) වයස දහඅටට වඩා අඩු පුද්ගලයෙකු හෝ (ආ) වයස දහඅටට වඩා අඩු යැයි විශ්වාස කෙරෙන කවර හෝ පුද්ගලයෙකු පොලඹවන කවරෙකු වුව කරන්නේ ළමයෙකු පෙලඹවීමේ අපරාධය වන අතර, වරදකරු වුව හොත් දස වසරකට නොවැඩි සාමාන්‍ය හෝ බරපතළ සිර දඬුවමකට හෝ දඩයකට හෝ එම සිර දඬුවමට සහ දඩයට යන දෙකට ම යටත් කළ යුතු ය. 360ඉ වගන්තිය ඇතුළත් වූයේ 2006 අංක 16 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධිත) පනත යටතේ ය.

වග්නතිවලට වඩා මෙම වගන්තිය සුදුසු යැයි තර්ක කළ හැකි ය. මෙම වගන්තිය ඇතුළත් කර ඇත්තේ ළමා ලිංගික අපයෝජනයට විසඳුම් සෙවීමේ විශේෂ අභිප්‍රාය ඇතිව බැවිනි.

වඩා විශාල සාමාජීය සහ සංස්කෘතික වාතාවරණයන් තුළ සිදු වන ළමා ලිංගික අපයෝජනය සිදු වන තැන් සොයා ගැනීමේ අවශ්‍යතාව ද පවතී. ලිංගිකත්වයේ ඇතැම් ප්‍රකාශන මුළුමනින් ම පාහේ බිහිසුණු වෙද්දී ලිංගිකත්වය තහනම් විෂයක් ලෙස දිගට ම පැවතී ගෙන යන්නේ නම්, අප දැන් ක්‍රියා කරන්නේ ළමයෙකුට තමන් අපයෝජනයෙන් ආරක්ෂා කර ගත හැකි වීමේ ඉඩකඩට එරෙහිව යැයි කිව හැකි ය. රජය, තමන් පවත්වා ගෙන යන නීති මාර්ගයෙන් ද ඇතුළු බොහෝ ආකාරවලින්, අන්තරායකර ලෙස සදාචාරවාදී, අතිවිවේචනාත්මක සහ ගර්හාත්මක ආකල්පවලින් යුතුව ලිංගිකත්වය ග්‍රහණයට ගැනීමට සක්‍රියව දායක වෙයි.

## *365/365ඒ පදනම් කර ගෙන වරදකරු කෙරුණ හොත් LGBT පුද්ගලයන්ට ධනාත්මක ලෙස ප්‍රයෝජනයට ගත හැකි ශ්‍රී ලංකාව තුළ පවතින වෙනත් නීතිමය විධිවිධාන කවරේ ද*

මෙම කොටසේ දී වාර්තාව විමසා බලන්නේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය සහ මූලික අයිතිවාසිකම් පිළිබඳ එම සහතික කිරීම්වල විෂය පථය යි.

වර්තමානයේ දී, නීතියට අභියෝග කිරීම සඳහා ධනාත්මක ලෙස යොදා ගත හැකි එක ම දේශීය නීතිය මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය යි. කෙසේ වුව ද, සම්මුති කිහිපයක් යටතේ ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර නීතිමය බැඳීම් කිහිපයක් ඇත.

ශ්‍රී ලංකාව පුද්ගල පැමිණිලි ක්‍රියා පටිපාටිවලට ඉඩ සැලසෙන ජාත්‍යන්තර සම්මුති සහ ප්‍රඥප්ති කිහිපයක් අපරානුමත කර ඇතඃ එනම්, සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR), ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය, කාන්තාවන්ට එරෙහි සියලු ආකාර වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (CEDAW), සියලු ආකාර වාර්ගික වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ ICCPR සහ CEDAW සඳහා ඉදිරිපත් කෙරුණු දෙවන විකල්ප ගිවිසුම් කෙටුම්පත යි. එහෙත්, ජනාධිපතිවරයා ICCPR සඳහා ඉදිරිපත් කෙරුණු පළමු විකල්ප ගිවිසුම් කෙටුම්පත අපරානුමත කිරීම ව්‍යවස්ථානුකූල නො වේ යැයි 2006 දී ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේ ය, එවැනි පනත් ස්වෛරී තීරණ ගැනීමට ශ්‍රී ලංකා රජයට ඇති අයිතිය කෙරෙහි බලපාන බවත්, එම නිසා එවැන්නක් බලාත්මක කළ හැක්කේ පාර්ලිමේන්තුව තුළ බහුතරයක අනුමැතිය ලැබුණොත් සහ ජනමත විචාරණයකට ලක් කෙරුණොත් පමණකි යි පවසමින් ක්‍රියාවලිය පිළිබඳ සමාලෝචනයක් කළ යුතු යැයි ඉල්ලා සිටියේ ය.

ශ්‍රී ලංකාව තුළ යොගියාකාර්ටා මූලධර්ම බලාත්මක කළ නොහැකි වෙතත්, LGBT ප්‍රජාවට සමාන ආරක්ෂාවක් සපයන බව සහතික කිරීම සඳහා රජයට ඇති වෙනත් ජාත්‍යන්තර බැඳීම් මාර්ගයෙන් ඒවා රජයට පීඩනය එල්ල කරන්නේ යැයි තර්ක කළ හැකි ය.

ඕනෑ ම ජාතියක පුරවැසියන්ට සමානව සැලකිය යුතු යැයි, නිසි නීතිමය පටිපාටි පැවතිය යුතු යැයි සහ තම මතය පළ කිරීමට, රජයෙන් සම්පාදනය කෙරෙන කාර්යයන්හි නියැළීමට සහ සේවාවන් ලබා ගැනීමට හැකි විය යුතු යැයි මෙම ජාත්‍යන්තර බැඳීම් ඉල්ලා සිටී. මෙම සම්මුති ලිංගික නැඹුරුව කෙරෙහි ඒ හැටියට ම විශේෂ අවධානයක් යොමු නොකළත්, ලිංගික නැඹුරුව වෙනස්කම් කිරීමට පදනමක් නොවිය යුතු යැයි ජාත්‍යන්තරව පිළිගෙන ඇත. LGBT පුද්ගලයන්ගේ අයිතිවාසිකම් උදෙසා මානව හිමිකම් කමිටුව තීන්දු දුන් නඩු ද පවතී.[52] LGBT පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වෙනස්කම් නොකිරීම පදනම් කර ගත් ජාත්‍යන්තර සම්මුති යොදා ගත හැකි සහ යොදා ගත යුතු යැයි නීතිවේදීන්ගේ ජාත්‍යන්තර අධිකරණය ද පිළිගෙන ඇත.[53]

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය ශ්‍රී ලංකාවේ පුරවැසියන් සතු අයිතිවාසිකම් නියම කරයි.

***12 වන වගන්තිය*** නීතිය ඉදිරියේ සියලු පුද්ගලයන් සමාන බව ප්‍රකාශ කරයි.[54] නීතියේ සමාන රැකවරණය ලැබීමට ඔවුන්ට අයිතිය ඇති බව ද එය ප්‍රකාශ කරයි. LGBT පුද්ගලයෙකු අත් අඩංගුවට ගැනීමට එරෙහිව, විශේෂයෙන් ම කිසි ම සාක්ෂියකින් තොරව LGBT පුද්ගලයෙකු අත් අඩංගුවට ගනු ලැබ අඩන්තේට්ටම්වලට මුහුණ පා තිබෙන අවස්ථාවල දී අභියෝග කිරීම සඳහා මෙම වගන්තිය යොදා ගත හැකි ය.

***13 වන වගන්තිය*** පුද්ගලයෙකු අත් අඩංගුවට ගත් විට හෝ රඳවා තබා ගත් විට නිසි නීතිමය පටිපාටි අනුගමනය කරන බව සහතික කරයි.[55] LGBT පුද්ගලයන් අත් අඩංගුවට ගන්නා බොහෝ අවස්ථාවල දී, කිසි ම පටිපාටියක් අනුගමනය නොකෙරෙන අතර, බොහෝ LGBT පුද්ගලයෝ මහේස්ත්‍රාත්වරයෙකු හමුවට නොපැමිණවෙති. පොලීසියෙන් අත් අඩංගුවට ගැනෙන සහ අඩන්තේට්ටම්වලට ලක් වන අයට තොරතුරු සම්පාදනය කෙරෙන බවත්, ඔවුන් සම්බන්ධයෙන් නිසි නීතිමය පටිපාටි අනුගමනය කෙරෙන බවත් සහතික කිරීම සඳහා 13 වන වගන්තිය යොදා ගැනීමට පිළිවන් විය හැකි ය.

***14 වන වගන්තිය*** අදහස් පළ කිරීමේ නිදහස සඳහා සෑම පුරවැසියෙකුටම ඇති අයිතිය ආරක්ෂා කරයි.[56] මෙම වගන්තිය යටතේ සෑම පුරවැසියෙකුට ම භාෂණයේ නිදහස ඇත. කෙසේ වුව ද, LGBT පුද්ගලයන්

---

[52] Toonen v Australia

[53] http://www.unhcr.org/refworld/docid/4a783aed2.html

[54] (1) නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය.

[55] නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසි ම තැනැත්තකු සිර භාරයට ගැනීම නොකළ යුත්තේ ය. යම් තැනැත්තකු සිර භාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේ ය.

[56] 14. (1) සෑම පුරවැසියකුට ම - (අ) භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට;

සම්බන්ධයෙන් ගත් කල මෙය සීමා වී ඇති බව අපි දකිමු. ක්‍රියාව අපරාධයක් බවට පත් වන්නේ 365 සහ 365ඒ වගන්ති යටතේ පමණක් බවටත්, එම නිසා ලිංගික නැඹුරුව පිළිබඳ ගැටලු ආශ්‍රිත තොරතුරු පතළ කිරීම සහ දැනුවත් කිරීම සීම නොකළ යුතු බවටත් තර්ක කළ හැකි ය. එමෙන් ම, අදහස් පළ කිරීමේ නිදහස යටතේ පුද්ගලයෙකුගේ ස්ත්‍රී-පුරුෂ ක්‍රියාකාරිත්වය ආරක්ෂා කෙරෙන බවට සහ එම නිසා සංක්‍රාන්ති ස්ත්‍රීපුරුෂසමාජභාවී පුද්ගලයන්ට - 'කාන්තා ගතිලක්ෂණ ඇති' පුරුෂයන්ට සහ 'පුරුෂ ගතිලක්ෂණ ඇති' කාන්තාවන්ට - අඩන්තේට්ටම් කිරීම 14 වන වගන්තිය උල්ලංඝනය කිරීමක් වන බවට ද තර්ක කළ හැකි ය.

ඉහත සඳහන් කළ සියලු විකල්ප ලිංගික නැඹුරුව කෙරෙහි ඍජුව අවධානය යොමු නොකරන නමුත් ඒවා අර්ථ නිරූපණයට විවෘතව පවතින අතර, බොහෝ රටවල දී නීතියේ විෂය පථය පුළුල් කිරීම සඳහා සහ ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් නීතිය තුළට රැගෙන එන බව සහතික කිරීම සඳහා ඒවා ප්‍රගතිශීලී ආකාරයෙන් ප්‍රයෝජනයට ගැනේ.

ශ්‍රී ලංකාවේ දී, බුද්ධාගම සහ හින්දු ආගම වැනි ආගම් 'සමලිංගික ක්‍රියාවන්' සදාචාරාත්මක නොවන ක්‍රියාවන් ලෙස නොසලකන බවත්, වාස්තු විද්‍යාත්මක ව්‍යුහයන් කිහිපයක දී විවිධ ලිංගික ක්‍රියාවන් උත්කර්ෂයට නංවනවා නො වේ නම් පිළිගන්නා අයුරු අප දකින බවත් සඳහන් කිරීම ද වැදගත් වේ.

## *නිගමනය*

ශ්‍රී ලංකාවට ඇත්තේ LGBT පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දීර්ඝ ඉතිහාසයකි. සියලු දිස්ත්‍රික්කවල පැවැත්වූ සම්මුඛ සාකච්ඡා සාක්ෂි දරන්නේ, සමලිංගිකතාව සහ සමලිංගිකයන් පිළිබඳ උග්‍ර පිළිකුලක් පැතිර පවතින බව සහ වෙනස් ලිංගිකත්වයක් ප්‍රකාශයට පත් කරන්නන්ට එරෙහිව දිනපතා

'හරි දෙය' සහ 'වැරදි දෙය' කුමක් දැයි තීරණය කිරීමේ දී ඕනෑ ම සමාජයක නීතිය විශාල සංකේතාත්මක කාර්ය භාරයක් ඉටු කරන අතර, දැන් අපගේ සංස්කෘතියේ සහ සදාචාරයේ කොටසක් ලෙස අප සලකන විජිතවාදී නීති වන 365 සහ 65ඒ වගන්ති සම්බන්ධයෙන් ද මෙය සත්‍ය වන බව අපි දකිමු. 365 සහ 365ඒ වගන්ති බලාත්මකව පැවති කාලය තුළ දී ඒවා ඇතැම් ක්‍රියාවන් අපරාධ බවට පත් කිරීමෙන් ඔබ්බට ගොස් ඇත. ඒවා පොලීසියේ අපයෝජනයට ගොදුරු වීමට අත හරිමින් සහ වෛද්‍ය රැකවරණය සහ නීතිමය අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කරමින් සමස්ත පුද්ගල ප්‍රජාවකටම එරෙහිව වෙනස්කම් කරයි. බොහෝ රටවල දී මෙන් මෙහි දී ද අඩන්තේට්ටම් කිරීම සඳහා නීතිය යොදා ගනු ලැබේ. අපරාධ බවට පත් කිරීම නතර කිරීම සඳහා වන පියවරයන් නිර්මාණය කර අතරතුර, නීතිය බලාත්මක කර, පටිපාටි අනුගමනය කර, දැන් සිදු වන අයුරින් හුදු සැකය මත LGBT පුද්ගලයන් අත් අඩංගුවට නොගැනීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන LGBT පුද්ගලයන්ට ශ්‍රී ලංකාව තුළ ජීවත් විය හැකි බව සහ ශ්‍රී ලංකාව තුළ සම්පාදිත නීති භුක්ති විඳිය හැකි බව සහතික කිරීම වැදගත් වේ.

# නිර්දේශ

- වැඩිහිටියන් පෞද්ගලිකව සමාන ලිංගිකයන් සමග ස්වකැමැත්ත ඇතිව ලිංගික සංසර්ගයෙහි යෙදීම අපරාධයක් බවට පත් කිරීම නතර කිරීම.
- ප්‍රසිද්ධ සහ පෞද්ගලික ජීවිතයේ සියලු ක්ෂේත්‍රවල දී ලිංගික නැඹුරුව පදනම් කර ගෙන වෙනස්කම් නොකරන බව සහතික කරන නීති සම්මත කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම. සමාන රැකවරණය, සමාන අවස්ථා සහ නිසි අයිතිවාසිකම් සහතික කිරීම.
- රජය පොලීසිය සඳහා වන පුහුණු සැසිවලට මුල පිරීමේ දී ඔවුන් LGBT ප්‍රජාව මුහුණ පාන ගැටලු පිළිබඳව සංවේදී කරන බවට සහතික විය යුතු ය. නෛතික ව්‍යුහයේ මුහුණත වන පොලීසිය සංවේදී කිරීම. රාජ්‍යයට
- පොලිස් ප්‍රචණ්ඩත්වය සහ අඩන්තේට්ටම් කිරීම් සිදු වන සහ LGBT පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු අවස්ථාවල දී විධිමත් සහ සංවේදී නීතිමය උපදෙස් සැපයිය හැකි බව සහතික වන අයුරින් නීතිඥයන් ද සංවේදී කළ හැකි ය.
- නීතිය, අයිතිවාසිකම් සහ නීතිමය රැකවරණ යන්ත්‍රණයන් පිළිබඳව LGBT ප්‍රජාව අතර දැනුවත්කම ඇති කිරීම.